# දැන්වීමයි

හම්බන්තොට ඉන්දියානු කොන්සියුලර් කාර්යාලය විසින් රුහුණ විශ්වවිද්‍යාල සිසු සිසුවියන් සහ සේවක හවතුන්ගේ මෘදු කුසලතා වර්ධනය කිරීම සඳහා සංවිධානය කරනු ලබන වැඩසටහන් මාලාව යටතේ යෝග අභ්‍යාස පිළිබඳ දැනුවත් කිරීම සඳහා වන යෝග අභ්‍යාස වැඩ සටහනක් 2015.06.20 දින වැල්ලමඩම පරිශ්‍රයේ ගෘහස්ත ක්‍රීඩාගාරයේදී පැවැත්වීමට කටයුතු යොදා ඇත.

මෙම යෝග අභ්‍යාස වැඩසටහන යෝග අභ්‍යාස පිළිබඳ ඉන්දියානු ප්‍රවීණාචාර්යවරයකුගේ සහභාගීත්වයෙන් පැවත්වීමට නියමිත අතර මෙම වැඩසටහන් සඳහා සහභාගී වීමට ඔබ අපේක්ෂා කරන්නේ නම් ඒ පිළිබඳ ඔබ පීඨයේ පීඨ කාර්යාලය වෙත හෝ නේවාසික සිසුන් නම් තම නේවාසිකාගාරයේ පූර්ණකාලීන උපශාලාධිපතිට හෝ සේවක හවතුන් නම් ආයතන අනධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි වෙත 2015.06.17 දිනට පෙර දන්වන ලෙස මින් දන්වා සිටිමි.

මෙම වැඩසටහනට සහභාගීවීමේදී යෝග අභ්‍යාස සඳහා සුදුසු ඇඳුමකින් සැරසී එදින පෙ.ව. 9.00ට පෙර ගෘහස්ත ක්‍රීඩාගාරය වෙත පැමිණිය යුතුය.

10/06/2015

ආචාර්ය ඒ.එම්.එන්.අලගියවන්න
නියෝජ්‍ය උපකුලපති

ආචාර්ය ඒ.එම්.එන්. අලගියවන්න
නියෝජ්‍ය උපකුලපති
රුහුණ විශ්වවිද්‍යාලය
මාතර

පිටපත්

උපකුලපති - දැනගැනීම සඳහා

පීඨාධිපති (කළමනාකරණ හා මූල්‍ය/මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා/ධීවර හා සාගර විද්‍යා සහ තාක්ෂණ/විද්‍යා) පීඨය - පීඨ සිසුන් දැනුවත් කිරීම සඳහා

ලේඛකාධිකාරි - සියළු සේවක හවතුන්ට දැනගැනීමට සැලැස්වීම සඳහා

ශාලාධිපති/ශාලාධිපතිනි - දැන ගැනීම සඳහා

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි (ආයතන අනධ්‍යයන)
උපශාලාධිපති/උපශාලාධිපතිනි
} සේවක හවතුන් / නේවාසිකාගාර සිසු සිසුවියන් දැනුවත් කිරීමට සහ ලියාපදිංචි කිරීමට